රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/94 (III)

මගේ අංකය : EST/6/5/1/37-(II)
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.03.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/94 (II) චක්‍රලේඛයෙන් වැටුප් විෂමතාවකට ලක්වූ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 සහ 20/94 (II) අනුව සහන ලද ඌන සේවා උපාධිධාරීන්ට සහන සැලසීම.**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කළ 1994.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 හා 2005.07.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 (II) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02 ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ට සහන සැලසීමට 2005.07.15 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 (II) නිසා වැටුප් විෂමතාවකට ලක් වූ 1994.06.01 දින සිට 1994.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 අනුව හෝ 1994.08.01 දිනට පෙර දිනක සිට 2005.07.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 (II) අනුව සහන ලද ලිපිකරු හා සමාන්තර සේවාවන්හී I පන්තියේ නිලධරයන්ට පහත පරිදි සහන සැලසීමට 2016.02.23 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

(අ) 1995.04.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/94 (II) අනුව වැටුප් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් තිබුණ ද, 1994.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 හෝ 2005.07.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 (II) අනුව සහන ලැබීම නිසා එය නොලද ලිපිකරු හා සමාන්තර සේවාවන්හී I පන්තියේ නිලධරයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/94 (II) ක්‍රියාත්මක වූ 1994.08.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 හෝ 20/94 (II) අනුව සහන ලැබූ ලෙස සලකා කල්පිතව වැටුප් පරිවර්තනය කර 2008.01.01 දින සිට සංශෝධිත වැටුප සහ හිඟ වැටුප් ගෙවීම.

(ආ) මෙම විධිවිධාන, 1994.08.01 වන විට ලිපිකරු හා සමාන්තර සේවයක I පන්තියේ සිටියා වූ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/94 (II) අනුව වැටුප් ලබා ගැනීමට හිමිකම තිබූ නමුත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 (II) අනුව වැටුප් පරිවර්තනය කිරීම නිසා එම හිමිකම නොලැබූ ලිපිකරු හා සමාන්තර සේවාවල අභ්‍යාසලාභීන් නොවන උපාධිධාරීන්ට පමණක් අදාළ විය යුතුය.

(ඇ) ඉහත "(අ)" පරිදි වැටුප සංශෝධනය කිරීමෙන් පසු 2008.01.01 දින සිට හිඟ වැටුප් ගෙවීම.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 හෝ 20/94 (II) අනුව සහන ලැබ 1994.08.01 සහ 2008.01.01 දින අතර විශ්‍රාම ගොස් සිටින නිලධරයන්ගේ වැටුප ද ඉහත "(අ)" පරිදි සංශෝධනය කිරීමෙන් පසු අදාළ වන වැටුපට අනුව සංශෝධිත විශ්‍රාම වැටුපට හිමි හිඟ මුදල 2008.01.01 දින සිට ගෙවීම.

(ඉ) 2008.01.01 දින සිට මෙම චක්‍රලේඛය නිකුත් කරන දින තෙක් විශ්‍රාම ගත් ඉහත "(අ)" අනුව වැටුප සංශෝධනයට හිමිකම් ලබන නිලධරයන්ගේද වැටුප සහ විශ්‍රාම වැටුප සකසා හිඟ මුදල් ගෙවීම

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ හා ජාතික වැටුප් කොමිෂන් සභාවේ එකඟතාව මත නිකුත් කරනු ලැබේ.

ජේ. දඩල්ලගේ

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය